**ජාතික වැව්ලි කළමණාකරණ ආයතනය - 2017**

**-----------------------------------------------------**

ජාතික වැව්ලි කළමණාකරණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 76 , 1987 අංක 05 හා 2003 අංක 38 දරන පනත් මඟින් සංශෝධිත 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යාන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810)අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මතය

---

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික වැව්ලි කළමණාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

ප්‍රමිත අංක 08හි 22 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රතිපාදනයක් හඳුනාගත යුත්තේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැඳීමක් පවතින විටෙක එම බැඳීම පියවීමට ආයතනයේ සම්පත් පිටතට ගලා යන විට සහ එම බැඳීමේ ප්‍රමාණය විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කල හැකි නම් පමණි. එසේ වුවද විනය කරුණක් මත සේවයෙන් ඉවත්කරන ලද සේවකයකු විසින් 2011 දෙසැම්බර් 02 දින ආයතනයට එරෙහිව පවරා ඇති සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අවසන් වි නොමැති නඩුවක් වෙනුවෙන් අනාගතයේදී ගෙවිය යුතු වේ යැයි සලකා රු. 3,765.767 ක මුදලක් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

ආයතනය සතුව ඇති අක්කර 13 ක භූමියේ වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම<br>රු. | නොසැපයූ සාක්ෂි |
|---|---|---|
| ණය හිමියෝ | 14,785,807 | ශේෂ සනාථන ලිපි |
| ණය ගැතියෝ | 4,339,104 | |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වසර 04 ට අධික කාලයක සිට ලැබිය යුතු රු.239,901 මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 02 ක කාලයක සිට ණය හිමියන් 04 දෙනෙකු සඳහා ගෙවිය යුතු රු.233,665 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ද ගෙවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 371 | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගන්නා නිලධාරියා විසින් එම කාර්යය නිම කල විගසම අග්‍රිමය පියවිය යුතු වුවත් නිලධාරීන් විසින් අවස්ථා 29 දී ලබා ගෙන ඇති රු. 973,500 ක අත්තිකාරම් අදාල කාර්යය නිම වී දින 36 සිට දින 114 දක්වා කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 ඡේදය | සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද, ආයතනය විසින් එවැනි අනුමැතියක් ලබා නොගෙන නිලධාරීන් සඳහා වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර සමාලෝචිත වර්ෂයේදී රු.1,806,233 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,276,437 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 14,757,611 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,481,174 ක පිරිහීමක් විය. සේවකයින්ගේ වැටුප් සහ වේතන රු.6,225,293 කින් වැඩිවීම, සන්නිවේදන සහ උපයෝගීතා සේවා වියදම් රු.2,841,213 කින් වැඩිවීම සහ පුහුණු වියදම් රු.5,808,865 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,482,528 ක අතිරික්තයක් ඇති වී තිබූ නමුත් 2014 වර්ෂයේදී එය රු.1,833,579 ක ඌනතාවයක් වී තිබුණි. නැවත 2015 සහ 2016 වර්ෂයේ දී පිළිවෙලින් රු.632,438 ක හා රු.14,757,611 ක අතිරික්තයක් පැවති අතර 2017 වර්ෂයේදී එය රු.8,276,437 ක් දක්වා පිරිහී තිබුණි. කෙසේ වුවද ඉහත මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ දී රු. 32,281,537 ක් වූ ධන දායකත්වය 2017 වර්ෂයේදී රු. 67,606,912 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

-----------------------------------------------------------------

ආයතනයේ සේවයෙන් ඉවත් කර ඇති පුද්ගලයකු විසින් ආයතනයට එරෙහිව 2011 දෙසැම්බර් 02 දින කම්කරු උසාවියේ නඩුවක් පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------

**4.1 කාර්යසාධනය**

----------------

**4.1.1 සැලසුම් කිරීම**

-------------------

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක වී තිබූ වැඩසටහන් 06ක් ප්‍රකාශ පත්‍රයේ (Prospectus) හා ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් වී නොතිබුණි.

**4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිගණක ඒකකය සතුව පරිගණක 30 ක් පැවතියද ඒවා නිසි ලෙස උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුලදී රු. 572,600 ක් වියදම කර පරිගණක 05 ක් සහ අනෙකුත් උපාංග මිලදී ගෙන තිබුණි.

(ආ) අත්තිකාරම් ලබාදීමේදී පළමුව ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර නිලධාරින් 21 දෙනෙකු සඳහා එකතුව රු.620,000 ක්වූ අත්තිකාරම් නැවතත් ලබා දී තිබුණි.

(ඇ) ආයතනය සතු පුස්තකාලයේ කටයුතු පවත්වාගෙන යා යුතු ආකාරය හා ක්‍රියා පටිපාටි දැක්වෙන අත්පොත් (Manual) හෝ උපදෙස් මාලාවක් ආයතනය විසින් පිළියෙල කර නොතිබූ අතර ආයතනයේ නිලධාරින් 17 දෙනෙකු විසින් රු. 22,193 ක් වටිනා පොත් 71ක් 2014 මාර්තු 11 දින සිට 2017 දෙසැම්බර් 14 දක්වා කාලය තුල ලබා ගෙන නැවත ආයතනයට භාර දී නොතිබුණි.

4.3 **කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------------

2014 වර්ෂයේ සිට ආයතනයේ සහකාර අධ්‍යක්ෂක, පුස්තකාලාධිපති සහ ශ්‍රව්‍ය දෘෂ්‍යය සහකාර යන තනතුරු පුරප්පාඩු වී පැවතියද එම තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

----------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

--------------------------------------------------

තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික වැව්ලි කළමණාකරණ ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තිරසාර ඉලක්ක කරා ළගා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට අතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික වැව්ලි කළමණාකරණ ආයතනයේ කාර්ය භාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයක් ලෙස කුඩා වතු හිමියන් හා ඔවුන්ගේ සංවිධාන හා සමාගම් යන පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අදාල ඉලක්ක පිළියෙල කිරීමේදී සහභාගිත්වය අඩු වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| | පද්ධති සහ පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු පවතින තනතුරු සඳහා අදාල නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | කාර්යසාධනය | ආයතනය විසින් දැනට පවත්වනු ලබන අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලා සහ සංවර්ධන වැඩසටහන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකයක් ලබා දීමට කටයුතු නොකිරීම. |